# දකුණු පළාත් සභාව

-----------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම

#### 1.2.1 පළාත් සභා අරමුදල

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2013 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කරන ලදී. 2012 දෙසැම්බර් 31 දිනට පළාත් සභා සමුච්චිත අරමුදල රු. 373,144,340 ක්වූ අතර එය 2011 දෙසැම්බර් 31 දිනට රු. 370,476,392 ක්විය. 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ දී පළාත් සභා අරමුදල වර්ධනයවී තිබුණද, 2012 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව රු.104,099,540 ක් වූ වත්කම් ඉක්මවූ බැරකම් පැවති බව නිරීක්ෂණය විය.

#### 1.2.2 අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2013 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම්සංඛ්‍යාව | ඉදිරිපත් නොකළගිණුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | විසර්ජන ගිණුම් | 26 | 26 | - |
| (ආ) | ආදායම් ගිණුම් | 01 | 01 | - |
| (ඇ) | පළාත්රාජ්‍ය නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 92 | 84 | 08 |
| (ඈ) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 12 | 08 | 04 |
| (ඉ) | අරමුදල් ගිණුම් | 05 | 05 | - |
| (ඊ) | ප්‍රඥප්ති ගිණුම් | 05 | 02 | 03 |
| (උ) | වත්කම් බැරකම් ප්‍රකාශය | 01 | 01 | - |
| | එකතුව | 142 | 127 | 15 |

**1.2.3 නොසැසඳූ පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 08 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.352,359,085 ක් වූ අතර, පළාත් සභා අරමුදල් ගිණුම අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.373,153,655 ක් වුයෙන් රු.20,794,570 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ අයවැය හිඟය මූල්‍යණය යටතේ මධ්‍යම රජයෙන් ලැබුණු මූලධන ප්‍රතිපාදනය රු.1,084,830,000 ක් ලෙස දක්වා තිබුණද, ශීර්ෂ අංක 314 දකුණු පළාත් සභා විසර්ජන ගිණුම අනුව එය රු.1,105,310,000 ක් විය. ඒ අනුව රු.20,480,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ අයවැය හිඟය මූල්‍යණය යටතේ අනෙකුත් අරමුදල් හා ලැබීම් ලෙස රු.55,301,598 ක් දක්වා තිබුණද, ගිණුම සමඟ දී තිබූ සටහන් අනුව එය රු.50,700,297 ක් විය. ඒ අනුව රු.4,601,301 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ අයවැය හිඟය මූල්‍යණය යටතේ තැන්පත් ගිණුම් සහ වගකීම්වල ශුද්ධ වෙනස ලෙස රු.334,935,533 ක් දක්වා තිබුණද,ගිණුම් සටහන් 14 අනුව එය රු.399,176,018 ක් ලෙස දක්වා තිබීම නිසා රු.64,240,485 ක වෙනසක් විය.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබූ මුදල් ශේෂය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව මුදල් ශේෂය අතර, පහත පරිදි වූ වෙනස්කම් විය.

| | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව මුදල් ශේෂය | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව මුදල් ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2012ජනවාරි 01 දිනට ශේෂය | 151,559,813 | 104,721,978 | 46,837,835 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 298,214,362 | 241,712,055 | 56,502,307 |

(ඉ) දකුණු පළාත් රුහුණු සංචාරක කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව විවිධ තැන්පත් ගිණුමේ ශේෂය රු.1,854,816 ක්වූ අතර විවිධ තැන්පත් ලේඛණය අනුව එම ශේෂය රු.1,627,618 ක් වුයෙන් රු.227,199 ක වෙනසක් විය.

**1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

වර්ෂ 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම පිළිවෙලින් රු.40,555,059 ක් හා රු.967,394 ක් විය.

### 1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

**(අ) පිළිතුරු නොළත් විගණන විමසුම්**

2012 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 203 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.431,883,448 ක් විය.

**(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

ආයතන 07 කට අදාල එකතුව රු.531,430,096 ක් වූ ගනුදෙනු සම්බන්ධයෙන් වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

### 1.2.7 නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලටඅනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනත | පාසැල් 4 කට හා ගුරු මධ්‍යස්ථානයක සේවයේ නියුතු විශ්‍රාම වැටුප් හිමිකම රහිත සේවකයින් 05 දෙනකුගෙන් රාජ්‍ය සේවා අර්ථසාධක මුදල් අයකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) xxiv වන පරිච්ඡේදයේ 4.1, 4.3 හා 4.4 වගන්ති | 2010 වර්ෂය තුළ විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.148,120 ක ණය ශේෂයක් සහ 2009 නොවැම්බර් 30 දින සේවය හැර ගිය නිලධාරියෙකුගේ රු.114,600 ක ණය ශේෂය 2013 සැප්තැම්බර් 30 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. |
| (ii)xxiv වන පරිච්ඡේදයේ 13.6 වගන්තිය | උත්සව අත්තිකාරම් ගෙවිය හැක්කේ මාස 12 ක කාලයක් තුළ එක් වරක් පමණක් වුවත්, එසේ මාස 12 ක කාලය ඉක්මයාමට පෙර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරින් 33 දෙනෙක් සඳහා නැවත රු.165,000උත්සව අත්තිකාරම් ගෙවා තිබුණි. |
| (ඇ) 2000 මාර්තු 02 දිනැති අංක 07/2000 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ 7(5) උප වගන්තිය හා1994 පෙබරවාරි 11 දිනැති අංක 11/94 හා 2000 මාර්තු 02 දිනැති අංක 7/2000 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | චක්‍රලේඛ උපදෙස් වලට පටහැනි ලෙස අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2007 ජුනි 15 දින සිට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලයේ උසස්වීම්වලදී අදාල වැටුප් පරිවර්තනයන් සිදුකර තිබුණි. |

| | |
|---|---|
| (ඇ)2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා 2006 දෙසැම්බර් 26 දිනැති අංක DMS/B/01/03/01/SA දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | (i) 2006 ජනවාරි 01 දිනට වැටුප් පරිවර්තනය කිරීමේදී 2005 දෙසැම්බර් 31 දිනට ලබමින් සිටි වැටුප වෙනුවට 2006 ජනවාරි 01 දිනට ලබමින් සිටි වැටුප සැලකිල්ලට ගෙන වැටුප් පරිවර්තනයන් කර තිබුණි.(2006 ජනවාරි 01 දිනට වැටුප 2005 දෙසැම්බර් 31 දින වැටුපට වඩා වැඩි අගයක් ගැනීම) 2006 ජනවාරි 01 දිනට වැටුප තුළ 2001 දෙසැම්බර් 28 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මගින් වැඩි කිරිමට යෝජිත වැටුප් වැඩිවීමේ සියයට 50 හෝ රු.750 ක මුදල ඇතුළත් බැවින් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සියළුම සේවකයින්ගේ 2006 වර්ෂයේ ගෙවන ලද වැටුප් දෝෂ සහිත විය.<br><br>(ii) 2006 ජනවාරි 01 දිනට පසුව බඳවා ගනු ලබන නිලධාරින්ගේ වැටුප් ආරම්භක පියවරේ තැබිය යුතු බව දක්වා තිබුණත් ඊට පටහැනිව අධිකාරියේ 2006 ජනවාරි 01 දිනට පසුව බඳවාගත් නිලධාරින්ගේ වැටුප් ආරම්භක පියවරට වඩා ඉහළින්තබා තිබුණි. |
| (ඉ)2009 ජුනි 01 දිනැති අංක 30(i) හා 2009 සැප්තැම්බර් 09 දිනැති අංක 30 ( ii) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ | චක්‍රලේඛය යටතේ වැටුප් පරිවර්තනයන් ආයතන සංග්‍රහයේ 7 පරිච්ඡේදයේ (4) උප වගන්තිය අනුව සිදුකළ යුතු බව දක්වා තිබුණත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ඊට පටහැනිව අදියරෙන් අදියර තැබීමේ පදනම මත වැටුප් පරිවර්තනයන් සිදුකර තිබුණි. |
| (ඊ) 2011 සැප්තැම්බර් 13 දිනැති අංක 43(1) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 (i) හා 30 ( ii) යටතේ වූ වැටුප් පරිවර්තනයන් වැරදි ලෙස සිදුකිරිම නිසා මෙම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරිමට නොහැකිවී තිබුණි. |
| (උ) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28, 2006 මැයි 26 දිනැති අංක 28 (1),2006 අගෝස්තු 31 දිනැති අංක 28 (ii) , 2007 අගෝස්තු 01 දිනැති අංක 36 හා 2007 ඔක්තෝබර් 15 දිනැති අංක 36 (1) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ | චක්‍රලේඛවල සඳහන් විධිවිධානවලට පටහැනිව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියක් රහිතව 2006 ජනවාරි 01 දින සිට 2012 ජනවාරි දක්වා සේවකයන් 60 දෙනෙකු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අළුතින් බඳවා ගෙන තිබුණි. |

| | |
|---|---|
| (ඌ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා 2006 දෙසැම්බර් 26 දිනැති DMC/B/03/01/03/01/SA දරනකළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය | කිසිඳු වැටුප් වැඩිකිරිමක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියක් රහිතව සිදු නොකළ යුතු බව දක්වා තිබියදී ඊට පටහැනිව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2008 ජුලි 01 දින සිට සියළුම මාණ්ඩලික නොවන සේවකයින්ට වැටුප් වර්ධක 4 ක වැටුප් වැඩිවිමක් ලබා දී තිබුණි. |

## 2. ආදායම් කළමනාකරණය

2007 වර්ෂයේ සිට 2012වර්ෂය දක්වා වූ වසර 6 ක බදු ආදායම සහ බදු නොවනආදායම පහත පරිදි වේ.

| වර්ෂය | බදු ආදායම | බදු නොවන ආදායම |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| 2007 | 1,428.78 | 714.51 |
| 2008 | 2,129.38 | 581.34 |
| 2009 | 2,105.00 | 508.86 |
| 2010 | 2,532.16 | 520.49 |
| 2011 | 3,704.70 | 569.92 |
| 2012 | 3,889.51 | 619.26 |

පහත සඳහන්නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාවට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08ක් විසින් එකතු කරනු ලබන ආදායමට අදාල හිඟ බදු වශයෙන් එකතුව රු. 26,109,826 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තාව අනුව බදු වර්ග 04 කටඅදාලව හිඟව තිබු ආදායම රු. 223,827,294 ක් වු අතර, එම හිඟ බදු ආදායම් අයකර ගැනීමට 2013 සැප්තැම්බර් 30 දින වන විටත් අපොහොසත් වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.477,243,879ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.133,301,763 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.343,942,116 ක පිරිහීම කෙරෙහි වියදම් රු.217,922,000 කින් වැඩිවීමත් රජයේ ප්‍රදාන රු.360,160,000 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

| විෂයය | 2012 | 2011 | මූල්‍ය ප්‍රතිඵලය වැඩි වීම (අඩු වීම) | මූල්‍ය ප්‍රතිඵලය වැඩිවීමේ(අඩුවීමේ) ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | % |
| ආදායම | 4,508,779 | 4,274,630 | 234,149 | 5.48 |
| වියදම | (18,030,535) | (17,812,613) | (217,922) | 1.22 |
| ඌණතාවය | (13,521,756) | (13,537,983) | 16,227 | (0.12) |
| රජයේ ප්‍රදාන | 13,044,512 | 13,404,681 | (360,169) | (2.69) |
| රජයේ ප්‍රදාන වලින් පසු (ඌණතාවය) | (477,244) | (133,302) | (343,942) | 258.02 |

### 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන්නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයකු විසින් විනය නියෝග අභියෝගයට ලක්කරමින් අධිකරණයේ පවරා තිබු නඩුවක්ද, අධිකාරියේ සේවකයන් විසින් උසස්වීම්, පාරිතෝෂිත ලබා ගැනීම, විශේෂ දීමනා, සේවක අර්ථසාධක, වැටුප් හා නඩු ගාස්තු ඉල්ලා කම්කරු කාර්යාලයේ පවරා තිබු පැමිණිලි 06 ක් ද විමර්ශනය වෙමින් පැවතුනි.

(ආ) පළාත්මාර්ග සංවර්ධන අධිකාරිය අපකීර්තියට පත් කිරිම සම්බන්ධයෙන් පුවත්පතකට එරෙහිවද, කූට ලේඛණ සකස් කිරිම සම්බන්ධව ආයතනයේ සේවකයෙකුට එරෙහිවද, අධිකාරිය විසින් අධිකරණයේ නඩු පවරා තිබු අතර ඒවා විභාග වෙමින් පැවතුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

**(අ) රජයේ ප්‍රදාන**

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ මධ්‍යම රජයේ ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | මුළු ශුද්ධ වෙන් කිරීම | තථ්‍ය වියදම | ඉතිරිය | |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| උපමාන පාදක ප්‍රදාන | 347.00 | 189.46 | 157.54 | 45.40 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,642.00 | 776.99 | 865.01 | 52.68 |
| සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය විදේශ ණය | 5.00 | 0 | 5.00 | 100.00 |
| අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතිය විදේශ ණය | 124.00 | 102.00 | 22.00 | 17.74 |
| යුනිසෙෆ් වැඩසටහන | 2.00 | 0 | 2.00 | 100.00 |
| පාසැල් 1000 වැඩසටහන (අ) | 25.00 | 20.48 | 4.52 | 18.08 |
| වතු අංශ පාසැල් සංවර්ධන වැඩසටහන | 20.00 | 16.38 | 3.62 | 18.10 |

**(ආ) දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශිෂ්‍යත්ව ප්‍රතිඵල පිළිබඳ නියැදි පරීක්ෂාවේදී ගාල්ල , ඇල්පිටිය සහ අම්බලන්ගොඩ කලාපවල පාසැල් 20 කට අයත් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි සිසුන් 2665 ගෙන් සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 106 පමණක් විය.1998 සිට 2012 දක්වා වු වර්ෂ 14 ක කාලය තුළ හම්බන්තොට කලාපයට අයත් පාසැල් 98 න් පාසැල් 27 ක සිසුන් 1468 ක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිට තිබුණද , ඉන් කිසිදු ශිෂ්‍යයෙකු විභාගය සමත්වී නොතිබුණි.

(ii) අ.පො.ස.(සා.පෙළ) විභාගයට අදාල ගණිතය, ඉංග්‍රීසි හා විද්‍යාව යන විෂයයන්වල ප්‍රතිඵල 2010 වර්ෂයට වඩා 2011 වර්ෂයේදී පිළිවෙලින් සියයට 9.51 කින්, සියයට 7.34 කින් සහ සියයට 8.41 කින් අඩු වී තිබුණු බව ගාල්ල, උඩුගම හා ඇල්පිටිය කලාපවලට අදාල ප්‍රතිඵල සැසැඳීමේදි අනාවරණය විය.

(ඇ) දකුණු පළාත් ආංශික සංවර්ධන සැලැස්ම යටතේ 2012 වර්ෂය සඳහා මොරවක අධ්‍යාපන කලාපයේ විදුහල් සඳහා වෙන්කර තිබුණු රු.3,367,000 ක මුදලින් රු.869,215 ක් පමණක් වැයකර තිබුණි.

ඉතිරිය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 74 ක් හෙවත් රු.2,397,185 ක් විය.ඒ අනුව කලාපයේ පාසැල්වල විෂයයන්ගේ ගුණාත්මක වර්ධනය සඳහා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ අපේක්ෂිත පරමාර්ථය ඉටුවී නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන්නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා ලේකම් කාර්යාලය සඳහා විදුලිය සම්පාදනය කර ගැනීම වෙනුවෙන් රු.3,875,500 ක් වැයකර 200KVA ධාරිතාවයෙන් යුත් විදුලි ජනක යන්ත්‍රයක් ස්ථාපනය කර වාර්ෂිකව එහි නඩත්තු කටයුතු සඳහා රු.75,000 ක් වැය කරතිබුණි. සභා ගර්භයේ සිසිලන පද්ධතිය ක්‍රියාත්මක කරන දිනවලදී එම විදුලි ජනක යන්ත්‍රය ක්‍රියාත්මක නොකර සාමාන්‍ය විදුලිය භාවිතා කර තිබූ අතර එසේ නොකොට සිසිලන පද්ධතිය ක්‍රියාත්මක කරන දින වලදී ඒ සඳහා විදුලි ජනක යන්ත්‍රය ක්‍රියාත්මක කළේ නම් ආයතනයේ මාසික විදුලි බිලෙන් රු.75,000 ක පමණ මුදලක් ඉතිරි කර ගැනීමට හැකියාව තිබුණි.

(ආ) සභාලේකම් කාර්යාලයේ විදුලි බිල් සටහන්වල රාත්‍රී 6.30 -10.30 දක්වා කාර්ය බහුල වේලාවන් සහ රාත්‍රී 10.30 - අළුයම 5.30 කාර්ය බහුල නැති වේලාවන් වෙනුවෙන් 2012 වර්ෂයේ පමණක් මසකට ඒකක 300 ත් 400 ත් අතර ප්‍රමාණයක් විදුලිය භාවිතා කර තිබුණත් එම කාලය තුළ විදුලිය අරපරිස්සමින් භාවිතා කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) නෙළුව ග්‍රාමීය රෝහල සතු දෙමහල් ගොඩනැගිල්ල නෙළුව ප්‍රාදේශීය සභාවට පවරාදීම සම්බන්ධයෙන් නිකුත් කළ විගණන විමසුමකට අනුව පත්කර තිබූ කමිටු වාර්තාවකින් කල් ඉකුත්වූ ඖෂධවල වටිනාකම රු.542,094 ක් ලෙස දක්වා තිබුණු අතර, එම මුදල වගකිවයුතු නිලධාරින්ගෙන් දෙපාර්තමේන්තු ගාස්තු සමඟ 2013 අගෝස්තු 31 දක්වා අයකර ගෙන නොතිබුණි.තවද 1995 ජනවාරි 27 දින සිට 2013 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ඖෂධ භාරව සිටි වෛද්‍යවරුන් තිදෙනෙකු විසින් තොග ලේඛන නිසි පරිදි සම්පූර්ණ කර නොතිබුණි.

(ඈ) ධීවර අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 6.5 ක වියදමින් ධීවර කාර්මිකයින් 213 කට G.P.S. උපකරණ 213 ක් මිලදීගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) 2012 මැයි 17 දිනැති ලිපියෙන් GARMIN 128 GPS ඒකක 50 ක් මිල දී ගැනීම සඳහා තෝරාගත් ආයතන 05 කින් මිල ගණන් කැඳවා තිබුණ ද ඒ බව ලිපි ලියාපදිංචි ලේඛනය අනුව සනාථවී නොතිබුණි.

(ii) මිල ගණන් කැඳවීමේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) GARMIN 128 GPS උපකරණ ඒකක 50 ක් හා GARMIN 72 GPS ඒකක 50 ක් මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවා තිබුණද ඇණවුම් ලිපියේ GARMIN 128 GPS උපකරණ ඒකක 115 ක් හා GARMIN 72 GPS ඒකක 93 ක් ලෙස සඳහන් කර තිබුණි.

(iv) ප්‍රසම්පාදන කමිටු තීරණයේ දිනය සඳහන් නොවූ අතර එහි මිලදී ගත යුතු උපකරණ සංඛ්‍යාව ද දක්වා නොතිබුණි.

(v) ධීවර සමිති සමග ඇති කරගත් ගිවිසුම පරීක්ෂා කිරීමේ දී ගිවිසුමේ ක්‍රියාත්මක දිනය හා අත්සන යෙදූ දිනය අතර වෙනසක් අනාවරණය වීම හා ඒ අනුව ගිවිසුමේ වලංගුභාවය පිළිබඳ ගැටලු සහගත තත්වයක් පැවතීම සහ වර්ග දෙකක GPS උපකරණ මිල දී ගෙන තිබුණද ගිවිසුමේ අදාල වර්ගය නිශ්චිතව දක්වා නොතිබුණි.

(vi) ධීවර සමිති වෙත ලබාදුන් GPS උපකරණ අදාල සමිතිවල ලියාපදිංචි ධීවර සාමාජිකයින් සඳහා බෙදාදුන් බවට බෙදුම් ලේඛන විගණිත දිනය දක්වාම ලබාගෙන නොතිබුණි.

(vii) මෙම උපකරණ 213 නිවැරදිව ප්‍රතිලාභීන්ට ලැබුණ බව තහවුරු කර ගැනීම සඳහා ධීවර කාර්මිකයින්ගේ නම්, ලිපිනය ,හැඳුනුම්පත් අංකය, ධීවර සමිතියේ නම, සමිති සාමාජික අංකය, උපකරණ ලබාගත් දිනය හා අත්සන ආදිය ඇතුළත් ගොනුවක් නඩත්තු කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රුපියල් මිලියන 2 ක වියදමින් ධීවර කාර්මිකයින් 43 දෙනෙකු සඳහා ඔරු ලබාදී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) මිල ගණන් කැඳවීමේ දී තෝරා ගත් ආයතන 05 කට ලිපි යැවූ බවට සාක්ෂි නොතිබුණි.

(ii) එක් ධීවර සමිතියකට ලබා දී තිබුණු ඔරු 13 කට අදාල ගිවිසුමේ ඔරුවල වර්ගය, ප්‍රමාණය දක්වා නොතිබුණි.

(iii) එම ඔරු 43 ලබාගත් ධිවර කාර්මිකයින්ගේ නම්, ලිපිනයන්, අත්සන ආදී වැදගත් විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඊ) ගාල්ල කලාපයට අයත් පාසැල් 04 ක ගුරුවරුන් 04 දෙනෙකු විසින් 1990 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුළ ලබා ගෙන තිබුණු වැටුප් රහිත නිවාඩු දින 1,339 ක් වෙනුවෙන්

රු.332,096 ක මුදලක් 2012 අගෝස්තු 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. තවද එක් මහා විද්‍යාලයක 2011 හා 2012 වර්ෂවලදී ගුරුවරුන් 04 දෙනෙකු විසින් ලබාගෙන තිබුණු වැටුප් රහිත නිවාඩු දින31 ක් වෙනුවෙන් අයකර ගතයුතු මුදල් 2012 දෙසැම්බර් වන විටත් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(උ) ඇල්පිටිය කලාපයේ පාසැල් 13 ක ගුරුවරුන් 14 දෙනෙකු 1999 වර්ෂයේ සිට 2011 වර්ෂයදක්වා කාලයතුළ වැටුප් රහිත නිවාඩු දින 1,916 ½ ක් ලබා ගෙන තිබු අතර වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකල යුතු මුදල් අඩු නොකර වැටුප් ගෙවා තිබුණි.

(ඌ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබානොගෙන මාතර කලාපයේ මහා විද්‍යාලයක ගුරුවරයෙකු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපාධි පාඨමාලාවක් හදාරා තිබු අතර ඒ සඳහා 2010 සහ 2011 වර්ෂ තුළදී වැටුප් රහිත නිවාඩු දින 240 ක් ලබාගෙන තිබුණි.

(එ) මාතර කලාපයේ කණිෂ්ඨ විද්‍යාලයකසේවයේ නියුතු උපගුරුවරයෙකු පරිවාස කාලය තුළ අනුමැතියකින් තොරව නිවාඩු 119 ක් ලබාගෙන තිබු අතර ඔහුගේ අකාර්යක්ෂමතාවය පිළිබඳ වරින්වර දැනුම්දි තිබුණි. එම ගුරුවරයාගේ වෛද්‍ය වාර්තාව පෞද්ගලික ලිපිගොනුවේ නොවු අතර ලිපිගොනුවද අසම්පුර්ණව පැවතුණි. ඒ අනුව ඔහු සම්බන්ධව ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 11 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඒ) 1994 වර්ෂයේ සිට අභ්‍යාසලාභී සහතික නොළත් ගුරුපත්විමක් ලබා විද්‍යාලයක නැටුම් පිළිබඳ උප ගුරුවරයා ලෙස සේවය කරන ගුරුවරියක් 1999 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා (2007 වර්ෂයේ නිවාඩු වාර්තා නැත) වර්ෂ 14 ක් තුළ වැටුප් රහිත නිවාඩු දින 958 1/2 ක් ලබා ගෙන තිබුණි. මේ හේතුව නිසා අදාල ගුරුවරියගේ සේවය හැර යාමේ ලිපිය නිකුත් කරන ලෙස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දන්වා තිබුණ ද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එම ගුරුවරිය සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් 2013 අප්‍රේල් වන විටත් ගෙන නොතිබුණි.

(ඔ) අම්බලන්ගොඩ කලාප කාර්යාලයේ 2010 වර්ෂයට සාපේක්ෂව 2011 දී ගණිතය විෂය සමත්වීමේ ප්‍රතිශතයේ අඩුවීම සියයට 02 සිට සියයට 66 දක්වා පරාසයක් තුළ විහිදී තිබුණ ද, කලාපය තුළ ගණිතය විෂය ඉගැන්වීමේ ගුරු පුරප්පාඩු කිසිවක් නොතිබුණි. තවද පාසැල් 07 කට අදාලව අ.පො.ස.(උ.පෙ.) හැදෑරීමට සුදුසුකම් ලැබු ප්‍රතිශතයද 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේදී සියයට 05 සිට සියයට 85 දක්වා පරාසයක ප්‍රමාණයකින් අඩු වි තිබුණි. කෙසේ වුවද මෙම කලාපයේ පාසැල්වල දූර්වල සිසුන්ට ගණිත විෂය දැනුම වර්ධනය කිරීම සඳහා විශේෂ සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම වෙනුවෙන් රු. 57,500 ක් වැය කර තිබුණ ද එමගින් ඵලදායි ප්‍රතිඵලයක් ලැබ් තිබුණු බවට සාක්ෂි නොතිබුණි.

(ඕ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2008,2009 හා 2010 වර්ෂවල ලබාගත් දුම්රිය බලපත්‍ර වෙනුවෙන් එකතුව රු. 26,089,938 ක මුදලක් ද දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපුර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ක) ගාල්ල කලාප කාර්යාලයට අයත් මහා විදුහලක ගුරුවරයකු මානසික රෝගී තත්ත්වයක් හේතුවෙන් 1990 වසරේ සිට2010 ඔක්තෝබර් 02 දින විශ්‍රාම ගැනීම දක්වා වැටුප් රහිත නිවාඩු 2,453 ක් ලබා ගෙන තිබුණද, එය නොසලකා වැටුප් ගෙවීම හේතුවෙන් ඔහුට රු. 967,449 ක් වැඩිපුර ගෙවා තිබුණි.ඉන් රු. 276,875 ක් වූ විශ්‍රාම පාරිතෝෂිතය අඩු කිරිමෙන් පසු තවදුරටත් ඔහුගෙන් අය කර ගත යුතුව තිබූ රු. 690,574 ක් 2012 නොවැම්බර් 30 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ග) අකුරැස්ස කලාප කාර්යාලයට අයත් කණිෂ්ඨ විද්‍යාලයක විදුහල්පති ලෙස සේවය කරන ලද ගුරුවරියක් 2010 අගෝස්තු 11 දින සිට 2013 ඔක්තෝබර් 30 දින දක්වා කලාප කාර්යාලයට අනුයුක්ත කර කිසිදු රාජකාරියක් නොපවරා වැටුප් ගෙවා තිබුණි.

(ජ) 2013 වර්ෂය සඳහා පාසල් සිසුන් වෙත බෙදාහැරීම සඳහා නිල ඇඳුම් රෙදි පැකට් 94,850 ක් කලාප කාර්යාලය වෙත ලැබී තිබූ අතර , බෙදාහැරීමේ ලේඛනය අනුව බෙදාහරින ලද ප්‍රමාණය 94,061 ක් විය. ඒ අනුව ඉතිරිවිය යුතු ප්‍රමාණය පැකට් 789 ක් වුවද 2013 ජුනි 12 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව ඉතිරි තොගය නිල ඇඳුම් පැකට් 2, 828 ක් වී තිබුණි.

(ට) දකුණු පළාත් පාසැල්වල සිසු දරුවන් වෙත 2007,2008 හා 2009 වර්ෂයන්ට අදාල ශිෂ්‍යාධාර මුදල් කලාප කාර්යාලය වෙත 2012 පෙබරවාරි , මාර්තු හා අප්‍රේල් මාසවල යවා තිබුණු අතර,2010, 2011, 2012 හා 2013 වර්ෂයන්ට අදාල මුදල් විගණිත දින වූ 2013 අප්‍රේල් 23 දින වන විටත් කලාප කාර්යාල වලට යවා නොතිබුණි. ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ලබා දීම මෙසේ ප්‍රමාදවීම සිසු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා බාධාවක් වී තිබුණි.

(ඩ) 2012 වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා ශිෂ්‍යාධාර හිමි මාස සඳහා හම්බන්තොට කලාපයේ පාසල් 11 ක ශිෂ්‍යාධාරලාභීන් 60 දෙනෙකු වෙනුවෙන් 2013 මාර්තු 21 දින තිස්සමහාරාම මහජන බැංකුව වෙත ලියන ලද රු. 284,500 ක් වටිනා චෙක්පත අගරු වී තිබූ අතර 2012 වර්ෂය වෙනුවෙන් හිමිවිය යුතු මුදල් විගණිත දිනය වූ 2013 ජුනි 12 දින වන විටත් අදාල ශිෂ්‍යාධාරලාභීන්ට හිමි වී නොතිබුණි.

(න) පරිවාස දෙපාර්තමේන්තුවේ වෘත්තිය පුහුණු පාඨමාලා හා අමතර පන්ති පැවැත්වීමට අවශ්‍ය උපකරණ මිලට ගැනිමේ වැය විෂයයට රු. 1,650,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.1,634,836 ක් උපදේශකවරුන් සඳහා වියදම් කර තිබුණි. එසේ වුවත් වෘත්තිය පුහුණු පාඨමාලාවන් ඉගැන්වීම වෙනුවෙන් විෂය නිර්දේශයන්ද, සිසුන්ගේ වාර පරික්ෂණ ප්‍රතිඵල ලේඛනද නොතිබුණු අතර මෙම ඉගැන්වීම් වසරකට මාස 08 ක පමණ කාලයක් සිදුකර තිබුණි.

(ප) භාෂා පරිවර්තන උපකරණ රු. 1,337,441 කට මිලට ගැනීම සඳහා පත්කරන ලද ඇගයීම් කමිටුව ලබාදී තිබුණු වාර්තාව අනුව උපකරණ සපයා සවිකර ක්‍රියාත්මක කර පෙන්වීමෙන් පසුව මුදල් ගෙවීමට නිර්දේශකර තිබුණි. එසේ උපකරණ සවිකර පරික්ෂා කිරිමකින් තොරව රු.1,000,000

ක් ගෙවා තිබුණි. උපකරණ 2012 අප්‍රේල් 03 දින ආයතනය වෙත ලැබී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම උපකරණ සවිනොකර ගබඩාවේ තබා තිබුණි.

(ඞ) රජයේ සංවර්ධන යෝජනා ක්‍රම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කාර්යක්ෂමව සිදු නොකිරීම හේතුවෙන් පහත පරිදි වැඩිපුර වන්දි මුදල් ගෙවීමට සිදුවී තිබුණි.

(i) රජයේ ලාල්පේ වැව සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ මූලික කටයුතු 2001 වර්ෂයේදී සිදුකර තිබූ අතර, එම අවස්ථාවේ තක්සේරු වටිනාකම රු. 389,675 ක් වී තිබුණි. අත්පත් කර ගැනීම ප්‍රමාදවීම හේතුවෙන් එම දේපල 2011 මැයි 06 දින නැවත රු. 943,500 කට තක්සේරු කර 2012 දී ඒ සඳහා රු.553,825 ක වැඩිපුර මුදලක් වන්දි ලෙස ගෙවා තිබුණි.

(ii) බෙලිඅත්ත මාතෘ හා ළමා රෝහල සංවර්ධනය සඳහා අක්කර 05 රූඩ් 02 පර්චස් 1.06 ක් අත්පත් කර ගැනීමට 2007 ජුනි 20 දින රු. 28,000,000 කට තක්සේරු කර 1979 දෙසැම්බර් 14 දිනැති අංක 67 දරන ගැසට් පත්‍රයේ 38 (අ) ප්‍රකාර අතුරු විධානය ඔක්තෝබර් 03 දින පලකර තිබුණි. අත්පත් කර ගැනීම කාර්යක්ෂමව සිදුනොකිරීම හේතුවෙන් 2011 පෙබරවාරි 03 දින වන විට නව තක්සේරුව අනුව වන්දි ගෙවීමට රු.46,645,000 ක ප්‍රතිපාදන අවශ්‍ය වි තිබුණු අතර ඊට අමතරව අතුරු විධානය පලකළ දින සිට ප්‍රමාද පොලි ගෙවීමට ද සිදුවී තිබුණි.

(iii) ගංගොඩගම ග්‍රාමීය රෝහලේ ළමා වාට්ටුවක් ඉදිකිරිම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 38 (අ) අතුරු විධානය 1979 දෙසැම්බර් 14 දින නිකුත් කළද, රු.940,000 ක වන්දි ප්‍රදානය 2007 මැයි 30 දින සිදුකර තිබුණි.මෙම ප්‍රමාදය හේතුවෙන් අතුරු විධානය නිකුත් කළ දින සිට වන්දි ගෙවූ දිනය දක්වා ප්‍රමාද පොලි වශයෙන් රු. 1,843,120 ක් ගෙවීමට සිදුවී තිබුණි.

(ම) සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ 2011 ඔක්තෝබර් 12 දිනැති අංක EC/G/R/L/2011 දරන ලිපියේ 3 ඡේදය ප්‍රකාරව වාර්ෂික සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමේදී හා අලුත් කිරීමේදී දේශිය ආදායම් කොමසාරිස්වරයාගේ හා පළාත් ආදායම් කොමසාරිස්වරයාගෙන් ලබාගත් බදු නිශ්කාශණ සහතික ඉදිරිපත් කළයුතු විය. අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2012 වර්ෂය සඳහා නිකුත් කර තිබූ බලපත්‍ර 5 ක් සහ සූරියවැව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂය සඳහා නිකුත් කර තිබුණු බලපත්‍රයක් සඳහා පළාත් ආදායම් කොමසාරිස්වරයාගෙන් බදු නිශ්කාෂණ සහතික ලබාගෙන නොතිබුණි.

(ය) ආහාර, සමුපකාර, අමාත්‍යාංශයේ ලේකම් විසින් 1993 ජනවාරි 28 දින බලපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ වතුරේගම පිහිටි අක්කර 4 පර්චස් 37.06 ක ඉඩම සම්බන්ධව පෞද්ගලික සමාගමක් සමඟ වාර්ෂිකව රු. 72,000 ක ට බදු ගිවිසුමකට බැඳී තිබුණි. අදාල සමාගම

2000 වර්ෂයේ සිට බඳුගෙවීම පැහැර හැර කර්මාන්ත කටයුතු කරගෙන ගොස් තිබුණි.2006 වර්ෂයේදී මේ පිළිබඳ පවරන ලද නඩුවේ තීන්දුව ප්‍රකාර සමාගමෙන් අයවිය යුතු රු.1,501,131 ක මුදලක් 2012 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට කර්මාන්ත නියෝජ්‍ය ලේකම් කාර්යාලය අපොහොසත්වී තිබුණි. විගණිත දිනය වූ 2013 සැප්තැම්බර් 30 දින වන විටත් අදාල දේපල හා ගොඩනැගිලි වල්බිහි වෙමින් අනාරක්ෂිතව කිසිදු කාර්යකට යොදා ගෙන නොතිබුණි.

(ර) සමුද්‍ර පුරා විද්‍යා සංචාරක ව්‍යාපෘතිය නමින් නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල සමඟ 2013 මාර්තු 20 දින රුහුණු සංචාරක කාර්යාංශය අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. මේ සඳහා දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ 2011 වර්ෂයේදී රු.1,700,000 ක්ද, 2012 වර්ෂයේදී රු.3,500,000 ක්ද ප්‍රතිපාදනය සලසා තිබුණි. එයින් 2011 වර්ෂයේදී රු. 1,672,836 ක් වැයකර කිමිදුම් උපකරණ මිළදී ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී බෝට්ටුවක් නිර්මාණය කිරීම සඳහා රු.3,130,305 ක් ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි.

(ල) හම්බන්තොට පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ 2010 මාර්තු 17 දිනැති ලිපිය මගින් එම කාර්යාලයේ වාහනයක් දකුණු පළාත් කෘෂිකර්ම ඇමතිවරයා වෙත 2010 මාර්තු 18 දින නිදහස් කර තිබුණි. එය 2010 අප්‍රේල් 27 දින ආපසු භාරදී තිබුණි. කෙසේ වුවද මෙම රථය 2010 අප්‍රේල් 09 දින අනතුරකට භාජනය වී තිබුණ අතර , දකුණු පළාත් මුදල් රීති 54.1.2 පරිදි අනතුර සම්බන්ධව පොලීසියට වාර්තා කිරීමක් සිදුකර නොතිබුණි. දකුණු පළාත් මුදල් රීති 54.3.1 අනුව මූලික පරීක්ෂණයක්ද නියමිත කාලය තුළදී සිදුකර නොතිබුණි. අනතුර සිදුවන අවස්ථාව වන විට රථය සඳහා කිසිදු ආකාරයක රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණු අතර අළුත්වැඩියාව සඳහා වැයවූ මුළු වියදමවූ රු.168,500 ක් අයකරගැනීමට හෝ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ව) තෙලිජ්ජවිල ගොවිපල තුළ ලේයර් ඒකකයක් ඉදිකිරීම සඳහා රු.798,200 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඒ සඳහා දිස්ත්‍රික් ඉංජිනේරු (වාරිමාර්ග) මාතර විසින් සකස් කර තිබුණ රු.775,000 ක් වූ ඇස්තමේන්තුවක් අනුමත වී තිබුණි.

(i) එම ඇස්තමේන්තුව හා සත්‍ය වියදම පරීක්ෂා කිරීමේදී වැය විෂයයන් 05 ක් සඳහා රු.88,930ක අධි ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි.

(ii) වැය විෂය අංක 13 පරිදි කුකුල් කොටුව සඳහා දැලක් ගැසීමටත් ඒ වටා දෙවරක් තීන්ත ආලේප කර 11 වන පන්තියේ දැව බිඩිං යෙදිය යුතු බව දක්වා තිබුණද, එහි අත්‍යවශ්‍ය වූ දැල්වල පිරිවිතර හා තීන්ත ආලේප කිරිමට ඇස්තමේන්තු කර නොතිබුණි. සකස් කර තිබූ දැල් දිරා යමින් පැවතුණු අතර එම දැල් ශක්තිමත් නොවීම මත තවත් දැලක් යෙදීමට පියවර ගෙන තිබුණි.

(ස) තෙලිජ්ජවිල ගොවිපලෙහි ගවගාල ඉදිකිරීම සඳහා මාතර දිස්ත්‍රික් ඉංජිනේරු(වාරිමාර්ග) විසින් අනුමත කර තිබූ රු.437,000 ක් වටිනා ඇස්තමේන්තුවකට අනුව දකුණු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් ප්‍රතිපාදන සළසා තිබුණි.

(i) මෙම ඉදිකිරීම සම්බන්ධව ගොවි සංවිධානයක් සමඟ 2011 ජූලි 27 දින එළඹ තිබූ ගිවිසුම අනුව මාස 02 ක කාලයක් තුළ වැඩ අවසන් කළ යුතුව තිබුණද, දින රහිත ලිපියක් මගින් 2011 දෙසැම්බර් 31 දින නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත අදාල ඉදිකිරීම් වැඩ අවසන් බව වාර්තා කර තිබුණි. කෙසේ වුවද ගිවිසුමේ 04 වන වගන්තිය පරිදි ප්‍රමාද ගාස්තු වශයෙන් රු.305,900 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ඇස්තමේන්තු වැඩ විෂය අංක 10 අනුව වහළ සඳහා පොල් දැව යොදා ඇස්බැස්ටස් ෂීට් යෙදීම වෙනුවෙන් රු.135,648 ක මුදලක් ගෙවා තිබුණද, යොදාගෙන තිබුණු දැව ප්‍රමිතියෙන් තොර ඇස්බැස්ටෝස් ෂීට් දැමීමට තරම් ශක්තිමත් නොවනබව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඟ) ලබුදූව නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ පොලිසැක් මළු 11,900 ක් සහ මධ්‍යම රජයේ ප්‍රතිපාදන යටතේ පොලිසැක් මළු 48,100 ක් මිලදී ගැනීම සඳහා 2010 වර්ෂය තුළදී රු.1,351,800 ක් වැයකර තිබුණි.මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2010 අගෝස්තු 11 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණයෙන් මිලදී ගතයුතු ප්‍රමාණය නිශ්චය කර නොතිබුණි.

(ii) 2013 පෙබරවාරි 12 දින වන විටත් නොබෙදා ගබඩාවේ රු.272,608 ක වටිනා පොලැසැක් මළු 12,170 ක් ඉතිරිවී තිබුණි. මෙසේ වසර 03 ක් පමණ කාලයක් ගතවී තිබීමෙන් ඒවායේ ගුණත්වය පහල යාම පිළිබඳව අවධානය යොමුවී නොතිබුණි.

(iii) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව,2010 – 2012 කාල පරිච්ඡේදය දක්වා පොලිසැක් මළු 47,830 ක් ගොවීන්ට බෙදාහැරීම සඳහා නිලධාරීන් 54 කුට නිකුත් කර තිබුණි. 2013 පෙබරවාරි 12 දින වන විට ගොවීන්ගේ දායකත්වය ලෙසින් පොලිසැක් මළු 28,196 ක් සඳහා රු.338,352 ක මුදලකට කුවිතාන්සි ලබාගෙන තිබුණි.නිකුත් කරන ලද පොලිසැක් මළු සඳහා රු.235,608 ක මුදලක් ගොවීන්ගේ දායකත්වය ලෙස 2012 දෙසැම්බර් 31 දිනට හිඟ හිට තිබුණි.

(ළ) 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අසරණ හා ආබාධිත පුද්ගලයින් 161 කට කෘෂි පුහුණුව හා ස්වයං රැකියා ආධාර ලබාදීම සඳහා රු. 2,155,416 ක් වැයකර තිබූ අතර 2011 වසරේදී පුහුණුව ලැබූ 21 දෙනාගෙන් 9 දෙනෙකු යොදාගෙන කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී ඉන් කිසිවෙකු ඵලදායි කෘෂි භෝග වගාවන් පවත්වා නොතිබුණි. සමාජසේවා නිලධාරීන් ව්‍යාපෘතියේ ප්‍රගතිය හා ඵලදායිතාවයන් සහ පවතින දුර්වලතා පෙන්වාදී තිබියදීත් ඒවා නොසළකා හැරීම මීට හේතු වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(අඅ) දකුණු පළාත් සභාවේ 2001 අංක 02 දරන ආගමික සාහිත්‍ය හා කලා සංවර්ධන කටයුතු පිළිබද ප්‍රඥප්තියේ දක්වා ඇති පරමාර්ථයන්ට සෘජුවම අදාල නොවන කාර්යයන් සඳහා 2012 වර්ෂය තුළ දී වවුචර් 68 ක් මගින් රු.2,419,200 ක මුදලක් වැයකර තිබුණි.

(අආ) දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයට වායු සමීකරණ යන්ත්‍ර මිලදි ගැනීමේදී එක් පෞද්ගලික ආයතනයකින් යන්ත්‍රයක් රු.220,499 ක් බැගින් යන්ත්‍ර 07 ක් සඳහා රු.1,543,493 ක ලංසුවක් ඉදිරිපත් කර තිබු අතර තවත් ආයතනයක් එක් යන්ත්‍රයක් රු.188,000 බැගින් යන්ත්‍ර 10 ක් සඳහා රු.1,880,000 ක ලංසුවක් ඉදිරිපත් කර තිබුණි. යන්ත්‍ර 07 ක් සඳහා මිල ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් රු.1,984,491 ක් ගෙවා යන්ත්‍ර 09 ක් මිලදී ගෙන තිබූ අතර අවම ලංසුව ඉදිරිපත් කරන ලද ආයතනයෙන් යන්ත්‍ර මිලදී නොගැනීම නිසා රු.292,491 ක අලාභයක් සිදුවී තිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කැකණදුර සත්ව ගොවිපොලට අයත් බිත්තර 4,200 ක ධාරිතාවයෙන් යුත් බීජ රක්නාගාරය නිසි ප්‍රමිතියට සැකසීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම නිසා අපතේ යන බිත්තර ප්‍රමාණය ඉහළ අගයක් ගෙන තිබුණි. ඒ අනුව 2011 හා 2012 වර්ෂවල පිළිවෙලින් රක්නාගාරයට ඇතුළත් කරන ලද බිත්තර ප්‍රමාණය වු 32,396 කින් හා 105,806 ක ප්‍රමාණයෙන් හොඳ පැටවුන් බිහිවූ ප්‍රමාණය 21,606 ක් හා 66,275 ක් විය. ඒ අනුව වර්ෂ දෙක තුළ අපතය සියයට 34 හා සියයට 37 ක් බව නිරික්ෂණය විය. එමෙන්ම බිහිවෙන කුකුළු පැටවූ අලෙවි කර ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් නොතිබිම හේතුවෙන් බිහිවෙන පැටවුන්ගෙන් යම් ප්‍රමාණයක් ද පිරිවැයක් දරමින් ගොවිපොළෙහි රඳවා ගැනීමට සිදුවි තිබුණි. තවද රක්නාගාරයට ඇතුල් කරන ලද බිත්තරවල වටිනාකම ලබාගත හැකි පරිදි ලේඛනයක්ද ගොවිපල විසින් පවත්වා නොතිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 මාර්ගෝපදේශය ප්‍රකාරව යම් වැඩ, භාණ්ඩ හෝ සේවා එකතු කළ අගය බද්දෙන් නිදහස්කර නොමැති නම්, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්/ සැපයුම්කරුවන් වෙතින් බදු ඉන්වොයිස් පත්‍රයක් ලබාගැනීමෙන් පසු සපයන ලද භාණ්ඩ මත හෝ කරන ලද වැඩ මත එකතු කරන ලද බදු ගෙවනු ලැබිය යුතු වුවත්, නියැදි පරීක්ෂාවේදී රු.2,494,695 ක් වටිනා බිල්පත් සඳහා එකතු කළ අගය මත බදු ඉන්වොයිස් පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) දක්ෂිණ ලිත ලිපිකවර හා කාල සටහන් මුද්‍රණය කිරීම වෙනුවෙන් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් මාසයේදී රු.3,151,600 ක් වැය කිරීම සම්බන්ධයෙන්පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1(අ) මාර්ගෝපදේශය අනුව ලංසු භාරගැනීම සිදුකළ බවට සාක්ෂි නොවූ අතර එම සංග්‍රහයේ 6.3.3 (ආ) මාර්ගෝපදේශයට පටහැනිව ලංසු වසා දැමීමෙන් දින 15 කට පසුව ලංසු විවෘත කර තිබුණි.

(ii) ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය අනුව රුපියල් මිලියන 1 ත් 2 ත් අතර, වටිනාකම් සඳහා කලින් දැනුම්දුන් දිනක, පහකට නොඅඩු ආයතන සංඛ්‍යාවකින් ලංසු කැඳවිය යුතු වුවත්, ලංසු කැඳවා තිබුණේ ආයතන 04 කින් පමණි.

(ඈ) ලබුදූව ගොවිපොල පවත්වාගෙන යාම

------------------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලබුදුව ගොවිපොල ආහාර සැකසුම් ඒකකයේ නිෂ්පාදනයට අවශ්‍ය සැපයුම් ලබා ගැනීම වෙනුවෙන් 2012 වර්ෂයේදී රු.7,664,986 ක් වැයකර තිබුණු අතර මෙම සැපයුම් ආයතන 2 කින් ලබාගෙන තිබුණි. 2012 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 හෝ 3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමක් කළ යුතු වුවද, සැපයුම් කරුවන් තෝරා ගැනීමේදී එසේ ලංසු කැඳවීමක් සිදු කර නොතිබුණි. 2007 ජූලි 31 දිනැති ඉඩම් හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපියක් අනුව සැපයුම් ආයතන දෙකකින් පමණක් 2007 වර්ෂයේ සිට මිලදී ගැනිම් සිදුකර තිබුණි.

(ii) කෘෂිභෝග වගාව, කිරි හා පශුධන හා ආහාර සැකසුම් යනාදි ප්‍රධාන නිෂ්පාදන අංශ කීපයක් ගොවිපල යටතේ පැවතියද, විධිමත්ව ගොවිපල ඵලදාව ලේඛනගත කිරීමේ ක්‍රියාවලියක් හා පිරිවැය ගිණුම් තැබීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. ගොවිපලෙහි දෛනික නිෂ්පාදන ප්‍රමාණය කොපමණද යන්න සහ එක් එක් නිෂ්පාදනයේ ඵලදායීතාවය පිළිබඳව තහවුරු කර ගැනීමට විගණනයේදී සාක්ෂි ඉදිරිපත් නොවිය.

(iii) ගොවිපල නිෂ්පාදන හා ආහාර සැකසුම් අංශයේ නිෂ්පාදන මිළ කිරීමේ ක්‍රමවේදයන් විගණනයට ඉදිරිපත් නොවිය.

(iv) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.16,541,078 ක අමුද්‍රව්‍ය තොග තිබියදී රු.23,642,436 ක් වටිනා අමුද්‍රව්‍ය තොග වර්ෂය තුළ මිළදී ගෙන තිබුණු අතර වර්ෂයේ භාවිතා කළ අමුද්‍රව්‍ය වටිනාකම රු.13,389,003 ක් විය. වර්ෂය අවසානයේ රු.26,794,510 ක් ඉතිරි තොග වශයෙන් දැක්වුණු අතර පරිභෝජනය කළ අමුද්‍රව්‍ය ප්‍රමාණය මුළු තොග ප්‍රමාණයෙන් සියයට 33 ක ප්‍රමාණය විය. ඒ අනුව විධිමත් කළමණාකරණයකින් තොරව තොග මිලදී ගෙන ගබඩා කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(v) ඉකුත් වර්ෂයේ වෙළඳ හා ලාභලාභ ගිණුම අනුව නොවිකිණී ඉතිරිව තිබූ තොගයේ වටිනාකම රු.16,171,937 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එම වටිනාකම රු.26,794,510 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව නොවිකිණී තිබූ තොගය සියයට 48 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

**4.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

**----------------------------------**

පළාත් පාලන දෙපාර්තමේන්තුවට අනුබද්ධිත ඉදිකිරීම් ද්‍රව්‍ය පර්යේෂණාගාරවලට 2012 වර්ෂය තුළ පරීක්ෂණාගාර උපකරණ මිළදී ගැනීම සඳහා 2012 අගෝස්තු 28 දින ආයතන තුනකින් මිළ ගණන් කැඳවා තිබුණි. මෙම මිළ ගණන් අතර එක් ආයතනයකට අනුබද්ධ ආයතනයක්ද මිළ ගණන් ඉදිරිපත් කර තිබූ අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම ආයතන දෙකෙහි මිළ ගණන් සසඳා කර තිබූ නිර්දේශ මත 2012 ඔක්තෝබර් 03 දින රු.1,703,744 කට මෙම උපකරණ මිලදී ගෙන තිබුණි. මිළ ගණන් ඉදිරිපත් කර තිබුණු අනුබද්ධිත ආයතනය උපකරණ විකිණීමක් කරනු නොලබන ආයතනයක් වන අතර එය මැණුම් කටයුතු සඳහා සේවා සපයන ආයතනයක් වන බව නිරීක්ෂණය විය. ඒ අනුව ඉහත මිලදී ගැනීම් සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් දෙන ලද නිර්දේශය පිළිබඳව විගණනයේදී සෑහීමට පත්විය නොහැකිවිය.

## 4.5 දූෂ්‍ය අක්‍රමිකතා

-----------------

දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් තේ පැල ලක්ෂ 25 ක් සැපයීම සම්බන්ධයෙන් 2006 ජුනි 30 දින සිට 2011 ජනවාරි 24 දින දක්වා වූ කාලය තුළ කොන්ත්‍රාත්කරුවෙකු සමඟ එකතුව රු.30,270,000 ක් වූ ගිවිසුම් 22 කට එළඹ තිබූ අතර, 2006 ජුනි 30 දින සිට 2013 මැයි 27 දක්වා කාලය තුළ කරන ලද ගෙවීම් සහ පැල සැපයීම සම්බන්ධ පරීක්ෂාවේ දී පහත කරුණු අනාවරණය විය.

(අ) ගිවිසුම් අත්සන් කිරීමට පෙර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව සියයට 1 ක කාර්ය සිද්ධි බැඳුම්කරයක් ලබා ගෙන නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශය ප්‍රකාරව සුරක්ෂණයක් ලබාගෙන කොන්ත්‍රාත් මුදලින් සියයට20 නොඉක්මවන අත්තිකාරම් මුදලක් ගෙවිය හැකි වුවත්, එසේ ලබා නොගෙන සැපයුම්කරුට අවස්ථා 17 කදී රු.22,638,000 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

(ඇ) 2006 ජුනි 30 දින සිට 2007 නොවැම්බර් 12 දින දක්වා කාලය තුළ එළඹ තිබූ ගිවිසුම් 6 ට අනුව සැපයිය යුතු පැල 900,000 සැපයීම මාස 01 සිට 13 දක්වා ප්‍රමාද කර තිබියදී තවත් පැල ලක්ෂ 10 ක් සැපයීම සඳහා 2008 දෙසැම්බර් 29 දින තවත් ගිවිසුම් 10 කට එලඹ රු.9,000,000 ක්, අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. එම ගිවිසුම් වලට අනුව පැල සපයා නොතිබියදී තවත් පැල ලක්ෂ 06 ක් සැපයීම සඳහා 2011 ජනවාරි 24 දින ගිවිසුම් 06 කට එළඹ එදිනම රු.3,600,000 ක් හා 2011 ජනවාරි 26 දින රු.3,600,000 ක අත්තිකාරම් ගෙවා තිබුණි.

(ඈ) 2007 මැයි 30 දින සිට 2011 ජුලි 27 දින දක්වා වූ කාලය තුළදී පැල 915,700ක් පමණක් සපයා තිබුණු අතර, ඒ වෙනුවෙන් ගෙවිය යුතු මුදල රු.9,732,374 ක් වුවද, අත්තිකාරම් සහ 2006 ජුලි 04 දින සිට 2011 පෙබරවාරි 15 දින දක්වා කාලය තුළ අවසන් ගෙවීම ලෙස කොන්ත්‍රාත්කරුට

රු.27,766,881 ක් ගෙවා තිබුණි. ඒ අනුව විගණන දිනය වූ 2013 මැයි 27 දිනට අධිකාරියට සිදුව තිබූ සෘජු අලාභය රු.18,034,507 ක් බව නිරීක්ෂණය විය.

(ඉ) බාහිර පුද්ගලයෙකු වෙත රු.18,034,507 ක මුදලක් අවුරුදු 2½ - 4 ½ කාලයක් පැවතීමෙන් රජයට අහිමි වූ පොලී ආදායම ආසන්න වශයෙන් රු.5,687,260 ක් වූ අතර එකතුව රු.23,721,767 ක් වන එම මුදලට දෙපාර්තමේන්තු ගාස්තු වශයෙන් රු.5,930,442 ක් ද එකතු වූ විට රු.29,652,209 ක මුදලක් සැපයුම්කරුගෙන් අය වියයුතු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඊ) ඉහත සඳහන් රු.29,652,209 ක මුදලින් රු.9,450,000 ක් සැපයුම්කරු විසින් අධිකාරිය වෙත ගෙවා තිබුණු අතර ඉතිරි මුදල වූ රු.20,202,209 ක් 2013 ඔක්තෝබර් 25 දිනවන විටත් අයකර ගෙන නොතිබුණි.

(උ) අධිකාරිය විසින් රු.18,034,507 ක මුදලක් පාරදෘෂ්‍ය භාවයකින් තොරව බාහිර පාර්ශවයකට ගෙවීමට කටයුතු කර තිබුණු අතර, එම ගනුදෙනුවට බලය ලබාදුන්, අනුමත කළ සහ සහතික කළ වගකිවයුතු පාර්ශවකරුවන්ට එරෙහිව 2013 ඔක්තෝබර් 25 දින වන විටත් කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.6 අරමුදල් ඌණ උපයෝජනය

------------------------------

ආගමික, සාහිත්‍ය හා කලා සංවර්ධන අරමුදලේ අරමුණු ක්‍රියාවට නැංවීම වෙනුවෙන් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන්, සංස්කෘතික අමාත්‍යාංශයට ලැබී තිබුණු රු.2,336,543 ක මුදලක් පළාත් සභාවේ ඒ ඒ මන්ත්‍රීවරුන්ගේ යෝජනා ක්‍රියාවට නැංවීමකින් තොරව 2012 දෙසැම්බර් 31 දින වන විටත් අරමුදලේ පැවති බව නිරීක්ෂණය විය.

## 4.7 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම පිළිබඳ ව්‍යාපෘතිය සඳහා ඉකුත් වර්ෂයේ මිලදී ගෙන තිබූ රු1,501,041 ක් වටිනා උපකරණ තොගයක් , 2013 අප්‍රේල් 12 දින දක්වාත්, වර්ග 54 කට අයත් රසායනික ද්‍රව්‍ය, රසායනාගාර උපකරණ , microscope Slides 4538 ක් සහ වර්ග 09 කට අයත් විවිධ උපකරණ 33 ක් 2012 නොවැම්බර් 02 දින වන විටත් නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) බද්දේගම දිසා රෝහලට ශල්‍යාගාර උපකරණ 61 ක් 1988 වර්ෂයේදී ලැබී තිබුණද, ශල්‍යාගාරය ආරම්භකර නොතිබීම හේතුවෙන් විගණන පරීක්ෂණ දිනය වූ 2012 නොවැම්බර් 23 දින දක්වාම එම උපකරණ නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) 2005 – 2006 වර්ෂවල National HIV/AIDS Prevention Project (NHAQPP) IDA Grand AOH/013 - CE ව්‍යාපෘතියේ මූල්‍යමය ආධාර යටතේ ළය චිකිත්සාගාරය පවත්වාගෙන යාම සඳහා හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල භූමියේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණද, විගණන දිනයවූ 2012 ජූලි 26 දින දක්වාම ගොඩනැගිල්ල අදාල කාර්යය සඳහා යොදා ගෙන නොතිබූ අතර ගොඩනැගිල්ලෙහි සවිකර තිබූ උපකරණ බාහිර පුද්ගලයින් විසින් ගලවාගෙන ගොස් තිබුණි.මෙම ගොඩනැගිල්ලෙහි මැලේරියා නිලධාරී කාර්යාලය ස්ථාපිත කිරීමට සැලසුම්කර තිබූ අතර, සොරාගෙන ගොස් තිබූ උපකරණ නැවත යොදා අළුත්වැඩියා කිරීමට රු.2,000,000 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි.

(ඈ) හබරාදූව පර්යන්ත රෝහලේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරි නිල නිවාසය රු.593,761 ක වියදමකින් අළුත්වැඩියා කර 2012 අගෝස්තු 15 දින කාර්යභාර වෛද්‍ය නිලධාරියාට භාරදී තිබුණද,2013 අගෝස්තු 26 දින දක්වාම එහි වෛද්‍යවරයෙකු පදිංචිවී නොතිබූ අතර දැනට එම නිල නිවාසය පිහිටි භූමිය වල් බිහිවෙමින් පැවතුණි.

(ඉ) ඉදිකිරීමට යෝජිත හම්බන්තොට තත්ත්ව පර්යේෂණාගාරය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් 2011 වර්ෂයේ දී රු.110,355 ක් වටිනා උපකරණ මිළදී ගෙන තිබුණ ද, විගණන දිනය වූ 2013 ජුනි 04 දින වනවිටත් එකී උපකරණ ගාල්ල තත්ත්ව පර්යේෂණාගාරය තුළ අනාරක්ෂිතව හා නිෂ්ක්‍රීයව රඳවා තිබුණි.

(ඊ) දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ජනාධිපති මූලාරම්භක ඒකකය නාමිකව පිහිටුවා වසර 1 ½ ක් ගත වී තිබුණ ද, නිශ්චිත කාර්යාලයක් ස්ථාපිත නොකිරිම නිසා රු. 9,438,311 ක් වටිනා පරිගණක හා කාර්යාල උපකරණ 2011 දෙසැම්බර් සිට 2013 සැප්තැම්බර් 30 දින දක්වා නිෂ්ක්‍රීයව පැවතුණි

(උ) අධ්‍යාපන අමාත්‍යාංශයේ පත්තලගෙදර ගබඩාවෙන් 2011 මාර්තු මස ගාල්ල විදුහලකට ලබා දී තිබූ ලක්ෂ 05 ක් වටිනා පියානෝව සංගීත විෂය ඉගැන්වීමට ගුරුවරයකු නොමැතිවීම හේතුවෙන් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඌ) දකුණු පළාත තුළ විවිධ හේතු මත වසා තිබූ පාසැල් 21 ක් වූ අතර, එම පාසැල් සතු ඉඩම් හා ගොඩනැගිලි කිසිදු කටයුත්තකට භාවිතා කර නොතිබුණි.

(එ) දකුණු පළාත තුළ ක්‍රියාත්මකවූ ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතියේ කාර්යාල පවත්වාගෙන ගොස් තිබූ සැලසුම් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ වූ කාමර කිහිපයක් පරික්ෂා කිරීමේදී ලිපිගොනු අල්මාරි, ලිපිගොනු කැබිනට් , ලිපිගොනු රාක්ක හා පරිගණක හා උපාංග ඇතුළු වර්ග 21 කට අදාල භාණ්ඩ 111 ක් ඵලදායි කාර්යයකට යෙදවීමකින් තොරව නිෂ්කාර්යව තබා

තිබුණි. මෙසේ කාර්යාලීය උපකරණ නිෂ්ක්‍රීයව තිබියදී 2012 වර්ෂය තුළ රු.169,436 ක් වටිනා කාර්යාලීය උපකරණ මිලදී ගෙන තිබුණි.

(ඒ) ගාල්ල කලාපයට අයත් පාසැල් 18 ක ගුරු නිවාස ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් එම විදුහල් වල කිසිදු ගුරුවරයකු පදිංචි වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද මෙම ගුරු නිවාස අළුත්වැඩියා කිරීමට ද කිසිදු පියවරක් දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි.

(ඔ) ගාල්ල දිස්ත්‍රික්කය තුළ පවතින එකම කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය වන පෝද්දිවෙල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රධානතම අරමුණ වනුයේ දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික නිලධාරින් හා ගොවින් සඳහා පුහුණුව ලබාදිමයි. එහෙත්2012 වර්ෂය තුළදී දේශනශාලාව පුහුණු වැඩසටහන් 16 ක් සඳහා දින 21 ක් යොදා ගෙන තිබුණු අතර නේවාසිකාගාර ගොඩනැගිල්ල පුහුණුලාභින් 71 ක් සඳහා දින පහකදි පමණක් ප්‍රයෝජනයට ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ පුහුණු මධ්‍යස්ථානයේ වත්කම්වල උපයෝජනය ඉතාම අවම තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 4.8 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මන්ත්‍රී නේවාසිකාගාර කුලියට ගැනීමේදී රජයේ තක්සේරුකරු එක් ගොඩනැගිල්ලක උඩු මහල පමණක් තක්සේරු කර තිබුණු අතර මුළු ගොඩනැගිල්ලම තක්සේරු කර නොගෙන බදුකරු ඉදිරිපත් කර තිබුරු.40,000 ක මාසික කුලියට සම්පූර්ණ ගොඩනැගිල්ලම 2012 වර්ෂයේදී කුලියට ගෙන රු.400,000 ක් 2012 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණි.

(ආ) 2011 දී රක්ෂණගත වටිනාකම රු.675,000 ක් වූ වාහනය, 2012 මැයි 03 දින රු.1,473,950 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණත් නිසි ප්‍රමිතියකින් අලුත්වැඩියා කටයුතු කර ඇති බවට විධිමත් සහතිකයක් ලබාගෙන නොතිබුණි. 2011 නොවැම්බර් මස රු.605,023 ක අතිරේක වියදම් දරා අලුත්වැඩියා කර තිබුණු අතර ඒ සඳහා රු.2,078,973 ක් දෙසැම්බර් 28 දින වන විටත් වැය වී තිබුණි.

(ඇ) මාතර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් 2011 දෙසැම්බර් මස රු.2,772,000 ට බස් රථයක් මිළදී ගෙන එය ජංගම රසායනාගාරයක් ලෙස පරිවර්තනය කිරීම සඳහා 2012 ජූලි 10 දින ගරාජයකට භාරදී තිබුණි. එම කටයුතු අවසන් නොකර 2013 මැයි 17 දින එය

නැවත කාර්යාලයට භාරදී තිබුණි.තවද බස් රථය ජංගම රසායනාගාරයක් ලෙස පරිවර්තනය කිරීමට පෙර ජංගම සේවාව සඳහා 2011 වර්ෂයේදී රු.1,894,432 ක් වටිනා ඖෂධ මිලදී ගෙන ගබඩාකර තිබුණි. ඒ අනුව මෙම කාර්යය සඳහා රු.4,666,432 ක් වැයකර තිබුණත් ඉන් කිසිදු ප්‍රතිලාභයක් 2012 සැප්තැම්බර් 30 දින දක්වා ලැබීනොතිබුණි. සැලසුමකින් තොරව කඩිනමින් මිලදී ගෙන තිබුණු බෙහෙත් තොගයද පාවිච්චියට ගතහැකි කාලය අඩුවෙමින් පැවතුණි.

(ඈ) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2012 ජනවාරි 29, 30 හා පෙබරවාරි 19, 20 යන දිනයන්හිදී නුවරඑළිය හෝටලයක පවත්වන ලද දකුණු පළාත්, පළාත් පාලන ආයතනවල නවක මහජන නියෝජිතයන් දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව සඳහා රු.1,001,575 ක් වැයකර තිබුණි. රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ 2007 පෙබරවාරි 28 දිනැති අංක සී.එස්.ඒ./සී1/40 දරනජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය අනුව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන සිය රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය පැවැත්වීම සඳහා හෝටල් තෝරා නොගත යුතු අතර, දේශීය සංචාරවලදී ආහාර පාන හා නවාතැන් වෙනුවෙන් ගෙවිය යුතු හෝටල් ගාස්තු රජයේ මුදලින් නිරවුල් නොකළ යුතු වුවත් ඊට පටහැනිව එම වියදම් කර තිබුණි.

(ඉ) ඇල්පිටිය කලාප අධ්‍යාපන බල ප්‍රදේශයේ පාසැල් අතුරින් පාසැල් 09 කට අදාල ශිෂ්‍ය සංඛ්‍යාව 106 ක් වූ අතර, එම පාසැල්වල උගන්වන ගුරු සංඛ්‍යාව 30 ක් බවද නිරික්ෂණය විය. මෙම ගුරුවරුන් 30 දෙනා වෙනුවෙන් පළාත් සභා අරමුදලින් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා රු.5,182,385 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.මෙම පාසැල් 09 අතුරින් එක් පාසලක එකදු ශිෂ්‍යයකුවත් ඉගෙනුම නොලැබුවද 2012 ජනවාරි සිට සැප්තැම්බර් 30 දින දක්වා රු.175,545 ක මුදලක් එක් ගුරුවරයකු වෙනුවෙන් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඊ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලයට වායු සමීකරණ 04 ක් සැපයීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණු මිල ගණන් අතරින් අඩුම මිළ ඉදිරිපත් කළ ආයතනය තෝරා නොගෙන සාධාරණ හේතු දැක්වීමකින් තොරව දෙවන අවම මිළ ඉදිරිපත් කර තිබූ ආයතනය තෝරා ගැනිමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කිරිම නිසා රු.109,625 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(උ) දකුණු පළාත් දුගී දුප්පත්කම දුරලීමේ අරමුදල

------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දකුණු පළාත් සභාවේ 1989 අංක 02 දරන ප්‍රඥප්තිය මගින් දකුණු පළාතේ ස්වයං රැකියා උත්පාදනය හා වෙනත් සංවර්ධන අරමුණු තුළින් දුගී දුප්පත්කම තුරන් කරලීම සඳහා විධිවිධාන සැලසීම පිණිස දුගී දුප්පත්කම දුරලීමේ චක්‍රීය අරමුදල 1989 වසරේ පිහිටුවා තිබුණි. 1989 වර්ෂයේ සිට 1993 වසර දක්වා කාලය තුළ පුද්ගලයින් 12178 දෙනෙකු සඳහා රු.57,300,750 ක ණය මුදල් ලබාදී තිබුණි. කෙසේ වුවද ඉන් පසු 1993 වර්ෂයේ සිට 2013 ජුනි දක්වා එම අරමුදලින් කිසිම ණය මුදලක් ලබාදී නොතිබුණි.

(ii) 2012 දෙසැම්බර් 31 දින වනවිටද රු. 38,029,609 ක හිඟ ණය ශේෂයක් පැවතුණු අතරම ණය මුදල් ලබාදීම සඳහා පිහිටුවන ලද සමුපකාර සමිති 41 න් මේ වනවිට සමුපකාර සමිති 37 ක ලියාපදිංචිය අවලංගු කර තිබුණි. එම සමිති විසින් ප්‍රතිලාභීන් 7,712 දෙනෙකුට ලබාදී තිබුණු ණය මුදලින් රු.30,322,937 ක්ද, දැනට ලියාපදිංචිය අවලංගු කර නොමැති සමිති 04 න් ණය ලබාදුන් 1,774 දෙනෙකු ගෙන් රු.7,655,765 ක්ද තවදුරටත් අයවීමට තිබුණි. ණය මුදල් ලබාදී දැනට වසර 21 ක් පමණ ගතවී තිබුණත් ඒවා අයකර ගැනීමට නිසි පියවර නොගැනිම නිසා ණය අයකර ගත නොහැකි තත්ත්වයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) මෙම අරමුදල යටතේ ණය මුදල් ලබාදීම සඳහා අරමුදලට ලැබී තිබූ රු.73,040,113 ක මුදලක් එම කාර්යය සඳහා නොයොදා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබියදී 2009 වසරේදී එම මුදල් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ආපසු ලබාගෙන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. පොලියද සමග 2012 දෙසැම්බර් 31 දිනට මෙහි ශේෂය රු.95,848,918 කි. 2008 මැයි 24 දිනැති අංක දපස/ප්‍රලේ/ 9/9/12 දරන ප්‍රධාන ලේකම්ගේ ලිපිය මගින් දකුණු පළාත් චක්‍රීය අරමුදලේ මෙම ස්ථාවර තැන්පතු ඵලදායී ව්‍යාපෘතියක යෙදවීමට සුදුසු ව්‍යාපෘති වාර්තාවක් සකස් කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත දන්වා තිබුණද, විගණන දිනය වූ 2013 මාර්තු දක්වාම එම වාර්තා සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) අම්බලන්ගොඩ සංචාරක නිකේතනය හා ප්‍රායෝගික පුහුණු පාසල ඉදිකිරීම
-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර සළකා බැලිය යුතු මූලික අවශ්‍යතා සපුරා නොගෙන කාර්යාංශය විසින් රුපියල් මිලියන 994 ක ඇස්තමේන්තු මුදලකට මෙම ඉදිකිරීම් කටයුතු

ආරම්භ කර තිබුණි.සභා අරමුදලින් රු. 5,329,069 වැය කිරීමෙන් අනතුරුව ඉදිරි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබුණි. මේ සම්බන්ධයෙන් 2012 අගෝස්තු 15 දිනැති අංක 608.5 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් මෙම භූමිය කලින් පැවති පරිදි අම්බලන්ගොඩ නගර සභාවට පවරාදීමටත්, මෙතෙක් කාර්යාංශය වැය කර තිබුණුරු. 5,046,025 ක් වූ මුදල නගර සභාවෙන් අයකර ගැනීමටත් තීරණය කර තිබුණි. කෙසේ වුවද, අම්බලන්ගොඩ නගර සභාවේ 2012 ඔක්තෝබර් 10 දිනැති අංක අම්/නස/02/03/05(1) දරන ලිපියෙන් කාර්යාංශය විසින් වැය කර ඇති රු.5,046,025 ක මුදල නගර සභාවේ එකඟතාවය පරිදි සිදුවූ ගනුදෙනුවක් නොවන බැවින් එම මුදල ගෙවීමට නොහැකි බව දන්වා තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර ඇති රු.5,329,069 ක සම්පූර්ණ මුදලම නිෂ්කාර්ය වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.9 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරියේ කාර්මිකාවන් වෙනුවෙන් සේවක අර්ථසාධක දායක මුදල් ගෙවීමේදී සම්පූර්ණ කළයුතු “C” වාර්තාව අසම්පූර්ණ වීම නිසා සියයට 1 ක අධිභාරයක් ලෙස රු.786ක්ද, 2007 සිට 2012 සැප්තැම්බර් දක්වා අධිකාරියේ ආදේශක නිලධාරින් වෙනුවෙන් සේවා නියුක්තයින්ගේ භාර අරමුදල වෙත ගෙවිය යුතුව තිබුණු රු.96,167 ක හිඟ මුදල හා නියමිත පරිදි දායක මුදල් නොයැවීම නිසා අධිභාර වශයෙන් රු.44,411 ක්ද 2012 වර්ෂයේදී ගෙවා තිබුණි.

(ආ) රිදියගම නිවර්තන නිවාසයේ කුකුළු ගොවිපල සඳහා 2010 සහ 2011 වර්ෂවල කුකුළු කෑම මිලට ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම හේතුවෙන් රු.938,315 ක පාඩුවක් සිදුවී තිබුණි.

## 4.10 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පළාත් සභාවේ විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන විසින් ඉදිකිරීම් සම්බන්ධ නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| කර්මාන්තයේ නම | ක්‍රියාත්මක කළ ආයතනය | 2012 දෙසැම්බර් 31 | නිරීක්ෂණය වූ අඩුපාඩු |
|---|---|---|---|

| | | | දිනට වියදම | |
|---|---|---|---|---|
| | ---------------------- | ------------- | ---------------- | ------------------------ |
| | | | රු. | |
| (අ) | ගා/බටුවන්හේන රත්නසිරි රාජකීය මහා විදුහල ගොඩනැගිල්ල | පළාත් ගොඩනැගිලි ඉංජිනේරු කාර්යාලය | 622,998 | නිසි ප්‍රමිතියටයකඩ ග්‍රිල්, දොරවල් හා ලොක් සවිනොකිරිම. |
| (ආ) | ගා/අගුළුගහ මහා විදුහල 80 x 20 ගොඩනැගිල්ල | - එම - | 1,029,506 | ඉදිකිරීම් පුපුරා කැඩී තිබීම, ගැලවියාම, උළුවහු දොරපියන්, දොර යතුරු ප්‍රමිතියට නොවීම, විදුලි පරිපථ අඩුවෙන් යෙදීම. |
| (ඇ) | ගා/සාරාලංකාර මහා විදුහල 90 x 25 ගොඩනැගිල්ල දෙවැනි අදියර | - එම - | 372,085 | ඉදිකිරීම් පිරිවිතරයන්ට අනුකූල නොවීම, කපරාරු නිසි ලෙස සිදුනොකිරිම, ජනෙල් වැසීමට නොහැකිවීම, බිත්ති සහ ග්‍රිල් අතර හිඩස් පැවතීම |
| (ඈ) | ගා/බටුවහන්හේන රත්නසිරි රාජකීය මහා විදුහල තෙමහල් ගොඩනැගිල්ල | - එම - | 6,622,998 | ටයිල් නිසි ලෙස අල්ලා නොතිබීම, ග්‍රිල් සහ දොරවල් 15 A , 13 A, socket outlet නිසිලෙස සවිකර නොතිබීම. |
| (ඉ) | නෙළුව කොස්මුල්ල, දූවිලිඇල්ල මාර්ගය | පළාත් මාර්ග සංවර්ධන අධිකාරි | 7,180,372 | විශාල ලෙස පළුදු වී මාර්ගය අබලන්වී තිබීම. |
| (ඊ) | මිගහ ජදුර , ඉහළකුඹුක්වැව මාර්ගය වැඩිදියුණු කිරිම | - එම - | 19,829,257 | ඇස්පෝල්ට් කොන්ක්‍රීට් යොදන ලද කොටස් අවම ගණකම නොතිබිම. |
| (උ) | බොරාල අද්දරවෙල මාර්ගය | - එම - | 20,753,022 | කැපුම් සාම්පල් අනුව A B C මිනුම් තිබිය යුතු ගණකම නොමැතිවිම. |
| (ඌ) | නෙළුව කන්ද පාර කොන්ක්‍රීට් කිරිම | නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 971,922 | කොන්ක්‍රීට් කර තිබූ පාරේ ස්ථාන 10 ක පමණ පුපුරා තිබීම හා ගල් ගැලවී ගොස් තිබුණි. |

**4.11 කාර්යමණ්ඩලපරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග, ප්‍රවෘත්ති, හා ග්‍රාමීය යටිතල පහසුකම්අමාත්‍යාංශය කාර්ය මණ්ඩලය 11 ක් වුවද රියදුරු, කාර්යාල කාර්ය සහායක, මුරකරු, කම්කරු හා බංගලා භාරකරු වශයෙන් සේවය කරන ස්ථිර හා අනියම් සේවකයින්ගේ අතිරික්තය 12 ක් විය. මෙයින් සේවකයින් 05 දෙනකුගේ වැටුප් දකුණු පළාත් මාර්ග සංවර්ධන

අධිකාරියෙන්ද ,තවත් අයකුගේ වැටුප් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන්ද ගෙවීම් කර තිබුණ ද එම සේවකයින් රාජකාරි කටයුතු සඳහා අනුයුක්ත කළ ස්ථාන දක්වා නොතිබුණි.

(ආ) අධ්‍යාපන ලේකම්ගේ 2003/38 දරන ගුරු සංඛ්‍යා නිර්ණය කිරීමේ චක්‍රලේඛයේ 2.2.2 ඡේදයට පටහැනිව අකුරැස්ස අධ්‍යාපන කලාපය තුළවූ පාසැල් 43 ක විදුහල්පති ශ්‍රේණිධාරීන් නොවූ ගුරු සේවයේ ගුරුවරුන් විදුහල්පති තනතුර සඳහා යොදවා තිබුණි. එසේ වුවද තවත් පාසැල් 06 ක විදුහල්පතිවරයාට අමතරව නියෝජ්‍ය විදුහල්පති හා සහකාර විදුහල්පතිවරුන් වශයෙන් විදුහල්පති ශ්‍රේණිධාරින් කිහිපදෙනෙකු සේවය කර තිබුණි.

(ඇ) තංගල්ල කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල තුනෙන්, කාර්යාල දෙකක කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ පුරප්පාඩු පැවතුණි. එම කොට්ඨාශ දෙකෙහි රාජකාරි කටයුතු ද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත පැවරී තිබු බැවින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වශයෙන් ඉටුකළ යුතු රාජකාරි බොහොමයක් කාර්යක්ෂමව ඉටු කිරීමට ඔහුට නොහැකි වී තිබුණි.

(ඈ) උඩුගම කලාපය තුළ පාසැල් 20 ක් පමණ ගණිතය හා විද්‍යාව විෂය ධාරාවන් යටතේ උසස් පෙළ හැදෑරීමට අවස්ථාව නොතිබුණ ද, අදාල සුදුසුකම් ඇති ගුරුවරු 37 දෙනෙකු අ.පො.ස. (සා.පෙ.) හා ප්‍රාථමික අංශයේ ඉගැන්වීම් කරන අතර එම ගුරුවරුන්ගේ වැටුප් වශයෙන් රු. 6,530,240 ක මුදලක් 2012 වර්ෂයේ ගෙවා තිබුණි.

(ඉ) ගාල්ල මහා විදුහල් දෙකක ගණිත හා විද්‍යා උපාධිධාරි ගුරුවරුන් 04 දෙනෙකු 12 හා 13 ශ්‍රේණිවල එම විෂයයන් ඉගැන්වීම කරන බව කලාප කාර්යාලයේ තොරතුරු වලින් අනාවරණය වුවද, පාසැල් තොරතුරු වලට අනුව 2011 හා 2012 වර්ෂයේ කිසිඳු ශිෂ්‍යයකු ගණිතය හා විද්‍යා විෂය ධාරව හදාරා නොතිබුණි.

(ඊ) තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලය

-----------------------------------------

(i) පාසල් තුනක ඉහළ ශ්‍රේණි දරන විදුහල්පති සේවයේ නිලධාරීන් නියෝජ්‍ය හා සහකාර විදුහල්පති තනතුරු දරමින් සිටියදී විදුහල්පති සේවයේ පහළ ශ්‍රේණි දරන නිලධාරීන් හා ගුරු සේවයේ නිලධාරීන් විදුහල්පතිවරුන් වශයෙන් පත්කර තිබුණි.

(ii) විදුහල්පති සේවයේ නිලධාරීන් 21 දෙනෙකු ප්‍රාථමික හා කණිෂ්ඨ පාසල්වල විදුහල්පතිවරුන් වශයෙන් පත්කර තිබියදී ගුරු සේවයේ නිලධාරින් 13 දෙනෙකු ජාතික පාසල් හා මහා විදුහල්වල විදුහල්පතිවරුන් වශයෙන් පත්කර තිබුණි.

(iii) කලාපයට අයත් පාසල් 107 අතුරින් පාසල් 60 ක විදුහල්පතිවරුන් වශයෙන් ගුරු සේවයේ නිලධාරීන් පත්කර තිබූ අතර නියැදි පරීක්ෂාවට ලක්වූ මුළු සිසුන් සංඛ්‍යාව 1208 ක් වූ පාසලක විදුහල්පතිවරයා හැරුණු විට විදුහල්පති සේවයේ තිදෙනෙකු නියෝජ්‍ය විදුහල්පතිවරුන් වශයෙන් පත්කර තිබුණි.

(iv) තංගල්ල කලාපයේ 1991 මැයි හා 2012 ඔක්තෝබර් අතර කාලය තුළ ගුරු නිවාසවල පදිංචියට පැමිණි ගුරුවරුන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු ගුරු නිවාස කුලී රු. 183,175 ක මුදලක් 2013 ජූලි 05 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(උ) වලස්මුල්ල කලාපය තුළ ගුරු අතිරික්තතා ඇති පාසල්වලින් ගුරු ඌණතා ඇති පාසල් වෙත ගුරුවරුන් අනුයුක්ත කිරීම නිසි පරිදි සිදු කිරීමට ක්‍රියාමාර්ග නොගැනීම නිසා මානව සම්පත්හි මනා කළමනාකරණයක් සිදු වී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| විෂය ක්ෂේත්‍රය | කලාපය තුළ පාසල්වල ගුරු ඌණතා සංඛ්‍යාව | කලාපය තුළ පාසල් වල ගුරු අතිරික්තතා සංඛ්‍යාව |
|---|---|---|
| ප්‍රාථමික | 05 | 06 |
| ගණිතය | 01 | 01 |
| ඉතිහාසය | 01 | 02 |
| ශාරීරික අධ්‍යාපනය | 02 | 01 |

## 4.12 වෙනත් පාර්ශවයන්ට මුදාහල මානව සම්පත්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගාල්ල මහා විදුහලක වැටුප් ලබන ගුරුවරුන් පස් දෙනෙකු, හමුදා සේවය, ක්ෂේත්‍ර විද්‍යාගාරය, බලපිටිය ඉංග්‍රීසි පුහුණු මධ්‍යස්ථානය, ගණිතාගාර කටයුතු හා පලාත් සභා මන්ත්‍රීවරයකුගේ කාර්යය මණ්ඩලයට මුදා හැර තිබූ අතර, 2012 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා එකතුව රු. 1,378,213 ක වැටුපක් ඒ සඳහා ගෙවා තිබුණි.

(ආ) ගාල්ල මහා විදුහලක ගුරුවරුන් 02 දෙනකු 2008 සැප්තැම්බර් මස සිට 2012 සැප්තැම්බර් 14 දක්වා ගාල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අනුයුක්ත කර පාසැල් වැටුප් ලේඛණයෙන් 2012 සැප්තැම්බර් 14 දිනට රු. 1,582,425 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

## 4.13 වාහනඋපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන ලේකම් කාර්යාලය හා දකුණු පළාත් සභාවේ අනිකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනය සතු වාහන පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි ප්‍රධාන ලේකම් නමින් ඇති සියළුම වාහන ඇතුළත් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කළයුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.

(ii) විගණන පරික්ෂණයේදී ප්‍රධාන ලේකම් නමින් වාහන 89 ක් පමණ හඳුනාගත හැකිව තිබු නමුත් ආයතනයේ වාහන ලේඛණයට ඇතුළත් කර තිබුනේ වාහන 36 ක් පමණි.

(iii) 1995 වර්ෂයේ මුදල් අමාත්‍යාංශය මගින් මිළට ගෙන දකුණු පළාත් සභාවේ පළාත් පාලන ආයතන වෙත ලබා දී තිබූ වාහන 36 ක අයිතිය ප්‍රධාන ලේකම් වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සෑම මාස 06 කට වරක් වාහනවල දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ පරික්ෂා කළ යුතු වුවද, සභාව සතු වාහන සම්බන්ධයෙන් විගණිත දිනය වු 2013 මාර්තු 12 දින වන විටත් එම පරික්ෂණ සිදුකර නොතිබුණි.

(ඇ) සහකාර මැතිවරණ කොමසාරිස්ගේ රාජකාරී කටයුතු සඳහා ලබාදී තිබුණු වාහනය 2011 දෙසැම්බර් 02 දින අනතුරට පත්වී තිබු අතර, එම රථයට පූර්ණ රථවාහන රක්ෂණාවරණයක් ලබාගෙන තිබියදීත් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකළ අළුත්වැඩියා වියදම් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රධාන අමාත්‍යාංශයේ වාහන අළුත්වැඩියා වියදම් පිළිබදව කරන ලද නියැදි පරික්ෂාවේදී 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වාහන 06 ක් වෙනුවෙන් රු.9,574,144 ක් වියදම් කර තිබු අතර, එම වාහන වසර 17 සිට 25 අතර පැරණි ඒවා විය.

(ඉ) ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත වාහන 57 ක් වෙනුවෙන් පූර්ණ වාහන රක්ෂණාවරනය සඳහා 2012 ඔක්තෝබර් 10 දින රු.1,702,373 ක් ගෙවා තිබුණත්2012 වර්ෂය තුළ අනතුරට පත් වාහන 06 ක් 2013 ජනවාරි 31 දින වන විටත් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. එම වාහන 06 න් වාහන 5 ක් සඳහා අනතුරෙන් සිදුවී තිබු අලාභ හානී තක්සේරුකර නොතිබුණි.

**4.14 වැඩිපුර ගෙවීම්**

පහත සඳහන් වැඩිපුර ගෙවීම් නිරික්ෂණය විය.

(අ) මිලදී ගැනීම් අවස්ථා දෙකකදී හා ඉදිකිරීම් අවස්ථා 07 කදී පිළිවෙලින් රු.177,196 ක් හා රු.1,890,970 ක් සමාලෝචිත වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ඌරුගස් මන්නාරු රජයේ රෝහලේ සෞඛ්‍ය සේවා නිලධාරිණියක් සේවයට නොපැමිණි කාලය වෙනුවෙන් රු. 79,438 ක් වැටුප් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණු අතර 2012 ඔක්තෝබර් 26 දින වන විටත්එම මුදල ආපසු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

## 05. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

ආයතන 15 ක් විසින් 2012 වර්ෂයට අදාලව සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරි සැලැස්ම

ආයතන 13 ක් විසින් 2012 වර්ෂයට අදාලව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

ආයතන 08 ක අභ්‍යන්තර විගණන අංශ පිහිටුවා නොතිබුණි.

### 5.4 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

2012 වර්ෂයේදී අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු 09 කවිගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

### 5.5 ප්‍රසම්පාදන සැලැස්ම

ආයතන 20 ක් විසින් 2012 වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර දකුණු පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් හා මානව සම්පත් කළමනාකරණය
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඉ) පාසැල් කළමනාකරණය
(ඊ) මිලදී ගැනීම් පාලනය